10

156

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Department of Education, Southern Province

## තෙවන වාර පරීක්ෂණය - 2022(2023)
## Third Term Test

| | | |
|---|---|---|
| 10 ශ්‍රේණිය<br>Grade 10 | **චිත්‍ර කලාව I**<br>**Art I** | පැය එකයි<br>One Hour |

නම/විභාග අංකය : ..........................................................................................................................................

- **සියලුම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේම** පිළිතුරු සපයන්න.
- පහත සඳහන් ඡායාරූපය ඇසුරු කරගෙන අංක 1 සිට 5 තෙක් ප්‍රශ්නවල හිස්තැන් පුරවන්න.



1. ශ්‍රී ලාංකික ජනතාවගේ මුදුන් මල්කඩ බඳු වූ මෙම වාස්තු විද්‍යාත්මක **නිර්මාණය** ......................................නමින් හැඳින්වේ.

2. මෙම සුවිශේෂ ආගමික ගොඩනැගිලි සං**කීර්ණය** හා සිතුවම් ..........................................................................යුගයට අයත් වේ.

3. මෙය ..........................................................රජතුමා විසින් ගොඩනගා ඇති බව සඳහන් වේ.

4. මෙහි සුවිශේෂීම ගෘහ **නිර්මාණ** අංගය වන පත්තිරිප්පුව **නිර්මාණය** කිරීමේ ගෞරවය ......................................ශිල්පියාට හිමි වේ.

5. මෙහි සඳකඩ පහන ..........................................................................හැඩයක් ගනී.

- **අංක 6 සිට 10 තෙක් දී ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

6.ගම්පල යුගයට අයත් ලංකාතිලක විහාරයේ ගෘහ නිර්මාණ කටයුතු කල දකුණු ඉන්දියානු ශිල්පියා කවුද?

.................................................................................................................................................

7. සෝලියස් මැන්දිස් ශිල්පියා විසින් ඇඳි හේමමාලා කුමරිය හා දන්ත කුමරු ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩම කරවීම නම් සිතුවම දක්නට ලැබෙන විහාරස්ථානය කුමක්ද?

.................................................................................................................................................

8.සට්ටනාදර් ශිව දේවාලයේ දැකිය හැකි "සුදු කුකුළා "නම් සිතුවම අඳින ලද ශිල්පියා කවුද?

.................................................................................................................................................

9.ලාක්ෂා කර්මාන්තයේ ලාක්ෂා කෙඳි භාවිතයෙන් සැරසිලි කිරීම හඳුන්වන්නේ කුමන නමකින්ද?

.................................................................................................................................................

10.හිඳි බුද්ධ ප්‍රතිමාවල දෙපා පිහිටුවීමේදී යටි පතුල් දෙක උඩ අතට සමව සිටින සේ තබා වාඩිවීම හඳුන්වන්නේ කුමන නමකින්ද? .................................................................................................................

- **අංක 11 සිට 5 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර තෝරා ,ඊට යටින් ඉරක් අඳින්න.**

11.පෝස්ටර් චිත්‍රයක තිබිය යුතු වැදගත්ම ලක්ෂණය වන්නේ,

1) අක්ෂර භාවිතයෙන් පණිවිඩය තීව්‍ර කල හැකි වීම.
2) විවිධ හැඩවලින් යුත් මානව රූප සංරචනය.
3) පණිවිඩයේ වේගවත් බව හා මනා නිමාව.
4) සංකේතාත්මක සරල හැඩතල භාවිතය.

12.ඇම්.සාර්ලිස් ශිල්පියාගේ සිතුවමක් නොවන්නේ,

1) සිද්ධාර්ථ කුමාරෝත්පත්තිය.
2) සිදුහත් කුමරු හා මව් බිසව.
3) පියුම් පිට වැඩීම.
4) මාර පරාජය.

13.මයිකල් ආන්ජිලෝ විසින් සිස්ටයින් දෙව් මැදුරේ අල්තාරය පිටුපස බිත්තියේ සිතුවම් කරන ලද සුවිසල් සිතුවමින්,

1) ආදම් මැවීම නිරූපණය වේ.
2) අන්තිම විනිශ්චය නිරූපණය වේ.
3) අවසාන භෝජන සංග්‍රහය නිරූපණය වේ.
4) ලෝකෝත්පත්ති කතාව නිරූපණය වේ.

14.ඇම්බැක්ක දේවාලයේ කැටයම් නිර්මාණය කිරීමේ ගෞරවය හිමි වනුයේ,

1) දේවේන්ද්‍ර මූලාචාරින්ටය.
2) ගනේශ්වරාචාර්ය ශිල්පියාටය.
3) දෙල්මඩ මූලාචාරින්ටය.
4) ස්ථපතිරායර් නම් ශිල්පියාටය.

15.වීනස් දි මේලෝ ප්‍රතිමාව නිර්මාණය කරන ලද ශිල්පියා වන්නේ,

1) පීඩියස්.
2) මයිරන්.
3) ප්‍රැක්සිටෙල්ස්.
4) ඇලෙක්සැන්ඩ්‍රොස්.

- **අංක 16 සිට 20 තෙක් දී ඇති වාක්‍යවල අර්ථය පැහැදිලි වන සේ සම්පූර්ණ වාක්‍ය බැගින් ලියන්න.**

16.ප්‍රෙස්කො බුවනෝ.............................................................................................................................

17.සාදිලිංගම්.....................................................................................................................................

18.වටදාගෙය.......................................................................................................................................


19.ගෝපුර...........................................................................................................................................


20.අබන්ධකථන ක්‍රමය..........................................................................................................................

- අංක 21 සිට 25 තෙක් දී ඇති රූපසටහන්වලට කිසියම් සබදතාවක් දක්වන රූපසටහන,ඉදිරියෙන් ඇති **A,B,C,D,E** යන රූපසටහන් අතුරින් තෝරා,එහි අක්ෂරය තිත් ඉර මත ලියන්න.

21  (......................)  A

22  (......................)  B

23  (......................)  C

24  (......................)  D

25  (......................)  E

- **අංක 26 සිට 30 තෙක් දී ඇති එක් එක් වාක්‍යයෙහි හිස්තැනට සුදුසු වචනය/ වචන යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.**

26.ග්‍රීක දාර්ශනිකයන්ගේ ක්‍රියාකාරී ඉරියව් නිරූපණය කරමින් සම්පිණ්ඩනය කර ඇති ඇතැන්ස් ගුරු කුලය......................................නම් ශිල්පියාගේ නිර්මාණයකි.

27.මහනුවර ත්‍රිත්ව දෙව් මැදුරේ සිතුවම් ඇදි .............................................නම් ශිල්පියා යුරෝපිය සංස්කෘතිය හා භූතලය වෙනුවට ශ්‍රී ලාංකීය සමාජ පසුබිම නිරූපණය කර තිබීම සුවිශේෂත්වයකි.

28.අඩි 1 යි අගල් 8 ක් උස ගල් කණු 34 ක් මත ඉදිවූ ..................................................විහාරයේ මහනුවර යුගයට අයත් සිතුවම් දැකිය හැකිය.

29.පත්තිනි හා දෙවොල් දෙවියන් මුල්කරගෙන පැවැත්වෙන ......................................................ශාන්ති කර්මය පහත රට නර්තන සම්ප්‍රදාය හා සම්බන්ධ ශාන්ති කර්මයකි.

30.ඉන්දුනිම්න ශිෂ්‍යාචාරයෙන් හමුවූ හිස මත අං යුගලයක් සහිත ශීර්ෂාභරණයක් පැළදි දේව රූපයක් සහිත මුද්‍රාව.................................නමින් හැදින්වේ.

- **අංක 31 සිට 35 තෙක් දී ඇති ප්‍රශ්නවලට F,G,H,I,J යන රූප සටහන් ඇසුරෙන් පිළිතුරු සපයන්න.**



F



G



H



I



J

31. F අක්ෂරයෙන් දැක්වෙන ඇලි ඇතුන් දන්දීම නම් සිතුවම දක්නට ලැබෙන විහාරස්ථානය කුමක්ද?
.......................................................................................................................


32. G අක්ෂරයෙන් දැක්වෙන ඉන්දුනිම්න ශිෂ්ඨාචාරයෙන් හමුවූ ලෝහයෙන් කරන ලද ප්‍රතිමාව කුමක්ද?
.......................................................................................................................

33. H අක්ෂරයෙන් දැක්වෙන කුරුළු දඩයම නම් චිත්‍රය ඇති තීබ්ස්වල සොහොන් ගැබ කුමක්ද?
.......................................................................................................................

34. I අක්ෂරයෙන් දැක්වෙන මයිකල් ආන්ජිලෝගේ කිරිගරුඬ ප්‍රතිමාව කුමක්ද?
.......................................................................................................................

35. J අක්ෂරයෙන් දැක්වෙන බයිසන් ගව රුව ඇඳ ඇති ස්පාඤ්ඤ ගල් ගුහාව කුමක්ද?
.......................................................................................................................

- ඔබ වෙත සපයා ඇති වර්ණ චිත්‍රය හඳුනාගෙන එහි කලාත්මක අගය විග්‍රහ කෙරෙන පරිදි අංක 36 සිට 40 තෙක් දී ඇති උප මාතෘකාවලට අදාලව අර්ථවත් වාක්‍ය පහක් ලියන්න.(තනි වචනයෙන් පිළිතුරු සැපයීම ලකුණු නොලැබීමට හේතුවක් වනු ඇත.)



36.ස්ථානය: .......................................................................................

.......................................................................................

37.ශිල්පියා: .......................................................................................

.......................................................................................

38.තේමාව: .......................................................................................

.......................................................................................

39.අඳින ලද මතුපිට හා මාධ්‍ය: .......................................................................

.......................................................................................

40.හැඟීම් ප්‍රකාශනය: ...........................................................................

.......................................................................................

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

තෙවන වාර පරීක්ෂණය - 2022(2023)
Third Term Test

| 10 ශ්‍රේණිය<br>Grade 10 | චිත්‍ර කලාව III<br>Art III | පැය දෙකයි<br>Two Hours |
|---|---|---|

- දිය සායම් ,පෝස්ටර් සායම් ,පැස්ටල් ඇතුළු අතේ නොගෑවෙන ඕනෑම වර්ණ මාධ්‍යයක් වර්ණ කිරීම සඳහා භාවිතා කල හැකිය.
- "අ" කොටසින් හෝ "ආ" කොටසින් හෝ "ඉ" කොටසින් හෝ එක් මාතෘකාවක් පමණක් තෝරාගන්න.

"අ" කොටස - චිත්‍ර සංරචනය

01.මුහුදු වෙරළක මාළු වෙළඳාමේ යෙදෙන ධීවර පිරිසක්

02.ආගමික ස්ථානයක වතාවත්වල යෙදෙන බැතිමතුන් පිරිසක්

03.වනයක නිදහසේ සැරිසරන අලි රංචුවක්

04. ක්‍රීඩා උත්සවයක උද්වේගතර අවස්ථාවක්

"ආ" කොටස - මෝස්තර නිර්මාණය

05.සාම්ප්‍රදායික සැරසිලි මෝස්තර ඇසුරින් කුෂන් කවරයකට අහල් 8X8 ප්‍රමාණයට සුදුසු මුලුතල මෝස්තරයක් නිර්මාණය කරන්න.

06. නිර්මාණාත්මක හැඩවලින් යුක්ත මල් සහ කොළ යොදා චීත්ත රෙද්දක් සඳහා මුද්‍රණයට උචිත අයුරින් ව්‍යාප්ත මෝස්තරයක් අහල් 9x9 ප්‍රමාණයේ අවකාශයක් තුල නිර්මාණය කරන්න.ව්‍යාප්තිය ගැන සැලකිලිමත් වන්න.

07.උත්සව අවස්ථාවකට භාවිතයට ගත හැකි පතාකයක් නිර්මාණය කරන්න.

"ඉ" කොටස - ග්‍රැෆික් චිත්‍ර

PAST PAPERS WIKI

08.තේ කොළ පැකට්ටුවක් සඳහා සුදුසු ඇසුරුමක් නිර්මාණය කරන්න.

09."රට නැගුමට සවිය අපෙන්."යන මාතෘකාවට වර්ණවත් පෝස්ටරයක් නිර්මාණය කරන්න.

WWW.PastPapers.WIKI

10.පාසලේ වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවයකට ඇරයුම් කෙරෙන ආරාධනා පතක් නිර්මාණය කරන්න.

Download past papers, notes, and more from Past Papers Wiki!


LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
G.C.E. O/L
විද්‍යාව
A9+
ඉංග්‍රීසි භාෂාව
ENGLISH LANGUAGE
සිංහල
G.C.E. O/L SINHALA
General English
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON DELIVERY
HOME DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440